©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

# අවසානයක් වූ මගේ_ආදරේ

## ( පෙරවදන)

මේ ජීවිතේ අපිට එක එක මිනිස්සු හම්බෙනවා

ඒ වගේම ඒ මිනිස්සු අපේ ජීවිත වෙනස් කරනවා

අඩු වයසෙන් කොළඹට ආපු ගොඩක් තරුණ ජීවිත අකාලයේ විනාශ වුනා වගේ තාමත් වෙනවා..

හරි මාර්ගේ ගිය අතලොස්සක් අය අතරින් වැරදි මාර්ගේ ගිය බොහො පිරිසක් තාමත් මේ ගෙන්දගම් පොළොවේ ජීවත්වෙනවා.

## ( මූලාරම්භය)

වෙලාව හරියටම හවස 4.30 කොළඹ කොටුවෙන් අනුරාධපුර බලායන සීග්‍රගාමි දුම්රිය අද වෙනදට වඩා පරක්කු ගතියක් මට තේරුනා...

අද සෙනසුරාද වර්ෂ දෙදහස් වීස්සක් වූ අප්‍රේල් 11 වෙනි සිකුරාද...

ලබන්නාවු සිංහල හා හින්දු අළුත් අවුරුද්දට ගමට යන්න ආවේ...

අවසන් වතාවට කොළඹට සමුදීලා හංසිත් එක් කරන් ආපහු කොළඹ කියන නරකාදියෙන් බේරිලා බිය ගුල්ලෙක් වගේ පැනලා යන්න හිතන්..

අතීත කතාව කොච්චර සොඳුරු වුනත් රළු වුනත් ඒකත් හිතේ තියන් මේ යන්නේ එදා අනුරාධපුර ග්‍රාමයෙන් කොලඹට ආපු ඒ අහිංසක පොඩි එකා වගේ..

අත පිරෙන්න සල්ලිත් එක්කම හිත පිරෙන්න

සෙනෙහසක් හංසි වෙනුවෙන් තියෙනවනේ කියන බලාපොරොත්තු එක්ක

ඒ හීන සැබෑ වෙන්න තියෙන්නෙ තව පැය කීයද දෙන්නත් එක්ක ගමේ ගිහින් අතේ තියෙන සල්ලි වලින් පොඩි කඩයක් දාගෙන ජීවත් වීමේ බලාපොරොත්තු ඇතුව..

දහසක් හීන බලාපොරොත්තු මැද මේ කොලොම්තොටට ගොඩ බැහැලා අදට අවුරුදු පහයි මාස හයක් කාත් කවුරුත් ණෑයෙක් නැතිව මේ රළු පොළොවට පය ගහපු මගේ ජීවිතේ විවිධ හැල හැප්පිම් එක්ක ගෙවන්න වුනා..

ඒත් එදා මං දෙමාපිය ආශීර්වාදය මැද අනුරාධපුරෙන් කෝච්චියට නැගලා ආපු මගේ අහිංසක ජීවිතේ එහෙම පිටින්ම වෙනස් වුනා...එහෙම වෙනස් වෙනවා කියලා දන්නවා නම් හීනෙන් වත් ඒ පැත්ත බලන්න හිතන්නෙ වත් නැහැ...

කාත් කවුරුත් කොළොම්තොටේ මගේ ජීවිතේ වෙනස් කලා..

අහඹු හමුවීම් ජීවිතේ වෙනස් කරනවා කිව්වට එදා රාජේන්ද්‍රන් අයියා හම්බ වෙනකන් මම දැනන් හිටියෙ නැහැ

අනුරාධපුර ඉදන් ආපු මේ අහිංසකයා කොළඹ රටේ මේ තරම් දරුණු කෙනෙක් වෙයි කියලා....

ඔව් මේක මගේ කතාව මේක කොහෙන් පටන් අරන් කොහෙන් ඉවර කරන්නද...

හිතාගන්න බැහැ  ඒත් අද මේ යන දුම්රියට එදා නගිද්දි හිතේ තිබ්බ සැනසීම අද නැති බව මට හොදකාරව තේරුණා...

ඔව් කොහේ තියෙන්නට කාත් කවුරුත් නැතුව මේ ගෙන්දගම් පොලොවේ අඩු වයසෙන් පය තියනවනම් හොදට හිතලා පය තියන්න ඕන මේ අවුරුදු පහ මගේ ජීවිතේම වෙනස් කලා..

කොහෙදෙ හිටිය මාව අද කොහේදෙ තැනක නතර කරලා..

ඒකත් මාරයා කොයි වෙලේද කියලා හිතාගන්න බැරි තැනක...

මගෙ කල්පනා ලොව බිඳුනේ ඈතින් ඇහුණ දුම්රියේ නළා හඩට..

"තුන්වෙනි වේදිකාවට දැන් පැමිණි සීග්‍රගාමි දුම්රිය අවිස්සාවේල්ල හරහා නොනවත්වා ධාවනය වන බවත් සියළුම ප්‍රධාන නගරයන් වල නතර කරන බවත්

ඔබලාට කරුනාවෙන් දන්වා සිටිමි.."

ඒක කිව්ව ගමන් ඒක සීග්‍රගාමි වුනේ කොහොමද කියලා මටත් හිතෙන්නෙ ගත්තා..

ඊළග දුම්රිය සද්දෙත් එක්ක මං නැගිට්ටේ...

"පස්වෙනි වේදිකාවට දැන් පැමිණෙන සීග්‍රගාමි දුම්රිය අනුරාධපුරය බලා නොනවත්වා ධාවනය වෙන බව කරුනාවෙන් දන්වා සිටිමි..

දුම්රිය පිළිබදව හදුන්වා දීමත් එක්ක..

මාත් හංසිත් දෙන්නත් එක්ක දුම්රිය එන දෙසට යනවත් සමග පිට හරහා මොකක් ඕ සීතල යමක් ඇදී ගිය බව මට තේරුණ අතර අත ගා බලද්දි යම්කිසි දෙයක් මගේ පිටේ ඇනී ඇති බව තේරුණා

පිටත් අල්ලන් පිටිපස්ස අත ගාපු මම අත ඉස්සරහට කරලා..

බලද්දි දුටුවේ මගේ දකුණු අත පුරා ලේ විශාල වශයෙන් ගෑවී ඇති බව..

ඒ සමගම පිටුපස්ස බලපු මම දුටු දෙයින් මගේ මුළු සරුවාංගෙම වෙව්ලන්න ගත්තා...

අවුරුදු දෙකයි මාස හතරක් පුරා මාත් එක්ක ආදරෙන් හිටිය හංසි ඔව් මගේ දේවදූතිය ලේ පෙරාගෙන මං දිහා බලලා හිනාවෙන්න ගත්තා..

" චමින්ද උඹට බැහැ මගෙන් බේරෙන්න උඹ යන්න නේ මතක් කරගනින් කරපු දේවල් උඹ මගේ පවුලට..

එහෙම කියපු හංසි වියරුවෙන් වගේ මා වෙතට පැන්නා මගේ වෙලාව හොදකමටද මන්දූ ඒ වෙලාවේම කෝච්චියෙන් පැන්න.

පොලිසියේ එක්කෙනෙක් මාව වත්තත් කරන්න වුනා...

වටේ රැස්වී හිටිය ජනකාය දකිද්දි පොඩ්ඩක් බියෙන් තැති ගැහුන හංසි එහෙමම බිම ඉදූ ගත්තේ සතුටු හිනාවක් මූවට එකතු කර ගනිමින්..

දැස් පෙනි නොපෙනි බොද වීමත් සමගම වගේ මගේ අතීතය මට මැවෙන්න ගත්තා..

## ( අතීත මතක)

වර්ෂ දෙදහස් දහ හතරේ නොවැම්බර් විසි පස් වෙනි අගහරුවාදූ හරියටම උදේ පහයි තිස් අටට තිබුන කොළඹ බලා එන දූම්රියට නැග්ග මං පැය පහකුත් විනාඩි හතලිස් හතක් තුල කොළඹ කොටුව බලා එන්නේ හිතේ දහසක් බලාපොරොත්තු තියාගෙන..

කාත් කවුරුත් නැති කොළොම්තොටේ හවි හරණක් නැතුව ජීවත් වෙන්න වෙනවා කියලා මතක් වෙද්දිත් මගේ හිතට මොකක්දෝ දෙයක් දැනුනා ඒත් මොනා කරන්නද එක පැත්තකින් අළි කරදර තව පැත්තකින් වතුර ප්‍රශ්න,

මේ ඔක්කොම එක්ක කට ගොන්නක් බීගත්ත තාත්තගේ අඩෝ වැඩියාව..

දුක් මහන්සින්වෙලා හම්බෙන සොච්චමෙන් කට ගොන්නක් බීගෙන එන තාත්තාගේ සිංහ නාදය අහල පහල ගෙවල් වලට පවා ඇහෙන්න තරම් දරුණු වුනා

ඉවසලා ඉවසලා බැරිම තැන මං තීරණය කලා කොළඹ එන්න...

මට එහෙම වාසනාව හම්බුනා ඒත් ඒක මගේ ජීවිතෙ හැරවුම් ලක්ෂය වුනා

එදා පිටකොටුවේ දුම්රිය ස්ථානයෙන් බැහැලා කෙලින්ම ගියේ මල්වත්ත පාරේ පිහිටි ෆෝන් බඩු විකුණන කඩේකට රස්සාවක් හොයාගන්න බලන්න..

දෙපාරක් තුන් පාරක් කොළඹ ආව ගියා වුනත් මේ නගරේ මට කියලා කවුරුත් හිටියේ නැහැ දන්න කියන කෙනෙක් හිටියේ නැහැ.

කකුල් කඩිත්තුව හැදෙනකන් ඇවිද්දත් කිසිම ප්‍රයෝජනයක් නැති වුනා..

දවස් තුනක් කෑමට දෙයක් නැතුව කොටුවේ ස්ටේෂන් එකේ නිදගෙන බොන්න තියෙන කරාමයෙන් මූහුණ හෝදගෙන ජීවිතේ ගෙවන්න වුනා..

අතේ කියලම තිබ්බේ සත්තකේටම රුපියල් දෙසීය දහයයි..

අම්මා දුන්න කරාඹු ජෝඩුවයි විතරයි කරන්නේ මොනාද කියලා හිතාගන්න බැරුව දෙළොවක් අතර තනිවුනා..

මිනිහෙක් වෙන්න ඇවිත් හිර වුනාදෝ කියලා හිතුන වාර අනන්ත තිබුනා..

ඒත් මොනවා කරන්නද ලැබෙන්න තියෙනවා නම් දෙයක් ලැබෙනවා වගේම ඒකෙ අනිත් පැත්තත් එහෙමයි..

දවස දෙකක් තුනක් විතරක් නෙමෙයි දවස් දහයක් කුසට මොකුත් නැතුව පාරේ තියෙන ටැප් එකෙන් වතුර බිබි හිටිය මට බඩගින්නත් ඔච්චම් කරන්න ගත්තා වගේ තේරුණා..

ඒත් එකම එක දවසක්.. රාජේන්ද්‍රන් අයියා හම්බ නොවෙන්න මාත් කොළඹට ඇවිත් ආපහු හැරිලා ගිය කොල්ලෙක් වෙන්න තිබ්බා..

"මහතයා මහතයා මොක්කද තනියම කරනොවා.."මහතයා කොහේ කෙනක්ද"

ඒ සද්දෙට මං පොඩ්ඩක් කවුද කියලා බැලුවා.

කළුවට කළුවේ විටක් හපාගෙන කට කොනකින් ඉන්න නන්නාදුනන පුද්ගලයා ගැන මට මොකක්දෝ වෙනසක් දැනුනා

"මහතයා මොක්කද මුහුණ බලනොවා

මාත් ටික දසක ඉදන් බලන් හිටියා මෙතනම තමා ඉන්නවා"

"මහතයා කාලද බීලද මොකද කරොනා"

එහෙම අහපු ඒ මනුස්සයා දිහා බැලුවේ මොනා කරන්නද කියලා හිතාගන්න බැරුව

" මහත්තයා යං මක්කා හරි කන්න"

" ඕන නැහැ අයියා කාල ඉන්නේ පොඩ්ඩක් නිදාගත්තා"

" මහතයා අපිලට පොයිය දනවනේ මාත් මෙච්චර දවස් බලාන තමා උන්නා.

" මහතයා අපිලා තමල තමා එහෙම කියලා අපිල ලගත් මනුස්සකම තිනෝවා..

එහෙම කියපු ඒ අයියා මාත් එක්ක ගොඩක් හිතවත් වුනා...

ගමේ ඉදන් ආපු දවසේ ඉදන් වෙච්ච හැමදෙයක්ම ඒ අයියට කියන්න වුනා..

ඒ අයියා නිකන් මගේම කෙනෙක් ගානට මට හිතුනා.

එ ලෙන්ගතු බැඳීම නිසා මගේ ජීවිතේ සාමන්‍ය දෙයක් වුනා...

අයියා වැඩ කරන තැනම මටත් ජොබ් එකක් අරන් දුන්න අයියා එයා ඉන්න කාමරේම මාව නවත්ත ගත්තා..

දෙන්නත් එක්ක නාට්ටාම් ජොබ් එක කරන්න ගත්තේ එකම විදියට..

ලැබෙන පඩියෙන් කාලා බීලා ඉන්න පුරුදු වුන අයිය බීම පොඩ්ඩක් අඩු කලා

එහෙම හිටපු අයියා එක පාරටම වෙනස් වෙන්න ගත්තා අතේ මිටේ යහමින් මුදල් ගැවසෙන්න ගත්තා..

"අයියේ මොකක් හරි වැරදි දෙයක් කරනවද කියල මට හිතෙනවා.

මං එහෙම ඇහුවේ හිතේ ඇති වෙච්ච සැකේට..

කටකොනකින් හිනාවක් හෙලපු අයිය අහස පොළොව ගැටලන්න වගේ ලොකු කල්පනාවක ගිලෙන්න ගත්තා.

විනාඩි පහක් විතර බලන් හිටියත් උත්තරයක් නොමැති තැන මට තේරුම් ගියා මිනිහෙක්ගෙන් කවදාවත් උත්තර නැති ප්‍රශ්න අහන්න හොද නැහැ කියලා...

මාසයක් දෙකක් යද්දි අයියගේ පොඩි පොඩි වෙනස් කම් දකින්න පුලුවන් හම්බුනා.

එක දිගට කල්පනාවෙන් ඉන්න එකත් හිත කොහෙදෙ තැනක පාවෙන ගතියකුත් තිබ්බා හරියට නිකන් අලුත්ම දෙයකට ඇබ්බැහි වෙච්ච බවක් මට තේරුණා...

හොදට තිබ්බ ඒ ශරීරය කෘෂ වෙන්න ගත්තේ බලන් ඉද්දිම වගේ..

"අයියේ මේ මොකො මොකක්ද ප්‍රශ්නේ?

" මල්ලෙයා අපිලට හැමදම පුරස්න තමා තිබ්ලා පුරස්න නෙත්ත අය නැහැ මල්ලෙයා..

එහෙම කිව්වම මට තේරුණා අයියා මොකක් හෝ ලොකු ප්‍රශ්නයක ඉන්නෙ කියලා.

" අයියේ ප්‍රශ්න කාටද නැත්තේ එහෙම කියලා ඒ පස්සෙ ඕනවට වඩා එල්බගෙන ගියාම දුක විතරයි හැමදාටම ඉතුරු වෙන්නෙ...

" ශා ශා මල්ලෙයා තත්න තේවල්

ඔහොම මාසයක් විතර ගතවුනා..

දෙන්නා එකටම තමා හැමදේම කලේ.. ඒත් එකම එක දවසක් ඒ අයියා දෙයක් ගෙනාවා ඒක සුදු පාට ලොකු පැකට් එකක් නිකන් ලුණු වගේ ඒත් ඒ ලුණු නෙවෙයි කියන එක මට තේරුම් ගන්න වෙලා ගියේ නැහැ

අයියගෙන් විස්තර ඇහුවම කිව්වෙ ඒ හෙරොයින් කියලා කොහෙන්ද ඇහුවම කිව්වෙ වසන්ත මුදලාලිගේ ගෙදරින් කිව්වා..

ඒකෙන් පොඩ්ඩක් හලාගත්ත අයියා ඊයම් කොළේකට දාලා අදිනවා මං බලන් හිටියා..

මටත් ආසාවක් ඇති වුනා පොඩ්ඩක් ගහලා බලන්න..

ගහලා විනාඩි විස්සක් විතර ඉදලා අයියා කොහෙ හරි යන්න ගියා..

ඒ පමාවට මාත් පොඩි උගුරක් ඇදලා දැම්මා..

ඒකත් රාජේන්ද්‍රන් අයියට හොරෙන්..

හිස කකියනවත් එක්ක..වමනේ යන්න එන ගතියක් මට තේරුනා

මගේ මුළු ඔළුවම රිදෙන්න ගත්තා..

දුවලා ගිහින් වැසිකිළියේ දෙර වහගන්නවත් එක්කම..

"මල්ලෙයා මල්ලෙයා මොක්කද වුනා කියලා ඇහුවා.."

දැන් දීපන්කෝ උත්තර

" අනේ නැහැ අයියා මං අරකෙන් චුට්ටක් ඇද්දා නිකන් වමනේ යන්න වගේ අයියා..

" ෂා ෂා මල්ලියා මොක්කද තමා කරනවා..

ඒවා හරි ජරාව තමා ඕකට වැටුනොත් සල්ලි ඉත්තු වෙන්නෙ නෙහ් අප්පා

ඕවා නාක වැඩ හොඳද

අපිල නම් දැන් වාසක අය මල්ලෙයා

ඔයියට තාම වාස තියෙනවා..

එහෙම කියපු රාජේන්ද්‍රන් අයියා දිහා මට බැලුනා...

මගේම සහෝදරයෙක් වගේ මං ගැන හොයන්න වුනා..

එදා ඒ බීපු කුඩ මගේ ජීවිතේ වෙනස් කලා වසන්ත මුදළාලි එක්ක කතා බහ කරලා..

මම කුඩු බිස්නස් එකට බැස්සා..

උදේම බඩු ටික මගේ අතට හම්බෙනවා වගේම හවසට සල්ලි දෙන්න මම පුරුදු වුනා..

මුලින් එකා දෙන්නට දුන්න කුඩු පස්සෙ කොළඹ ඉන්න හුඟක් අයගේ අත්වලට යන්න වැඩි කාලයක් ගියේ නැහැ..

මාසයක් විතර පාඩුවේ කරන් ඉන්නැද්දි මගේ වෙලාවටද නැත්තම් අවාසනාවටද මන්ද...

ඔත්තුවකට පැන්න මිරිහානේ යුනිට් එක

කෑළි තිස් පහක් එක්ක අත් අඩංගුවට ගත්තා..

එද එහෙම ගිය මට දැම්මේ එකම එක කුඩු පැකට් එකක් නිසා දවස් ද හතරක් වැළිකඩ රිමාන්ඩ් බන්ධනාගාරයේ ගත කරන්න වුනා

**( වෙනසක ඇරඹුමක්)**

ඒ දවස් දහ හතර තමා මගෙ ජීවිතේ වෙනස් කලේ.

පාතාලේ නම් දරාපු ලොකු ලොකු කෙරුම් කාරයෝ වගේම..

භයානක මිණීමරුවෝ පවා..

මට ආශ්‍රය කරන්න හම්බවුනා ඒ අතරින් දෙමටගොඩ අජිත් ආශ්‍රය කරන්න හම්බවීම..

තමා මගේ ජීවිතේ සොදුරුම කාලය කියන්න පුළුවන්..

" මල්ලී මොකද පස්සට වෙලා ඉන්නේ.."

එහෙම කතා කරපු කෙනා කව්ද කියලා බැලුවා

"මේ වරෙන් මල්ලි මම තමා දෙමටගොඩ අජිත් පොඩි කේස් එකකට මල්ලි ආවේ "

ඊට පස්සෙ දෙන්නත් එක්ක කතාබහ කලා අඳුන ගත්තා.

අජිත් එක්ක ඉන්න ලැබෙන කාලය වගේම අජිත් යන්න දින තුනක් තියෙද්දි මට ජීවිත කතාව කියන්න ගත්තා..

කාත් කවුරුත් නැතුව කොළඹ රත් කරපු දෙමටගොඩ පාතාලයෙ මුදුන් මුල් කඩක් වුන අජිත්ගේ ගැන්සිය එක්ක එකතු වෙන්න කියලා අජිත් මට කතා කලා..

දෙමටගොඩ පුරා නානාවිධ කප්පම් ගැනිම් වල මුලින් හිටිය දෙමටගොඩ අජිත්ගේ ලාබාලම ගෝළයා විදියට පාතාලයට අත්පොත් තියන කොට අවුරුදු විසි පහක් වත් නැති පොඩි කොල්ලෙක් මේ සමාජෙට හරි වැරැද්ද මොකක්ද කියලා තේරුම් ගන්න බැරිවුන..

එදා ඒ හයියෙන් මගේ කුඩු බිස්නස් එකත් ගානට කරගන්න ගමන්..

## ( අලුත් ගමනක පෙර මං සලකුණු)

මටත් ඕන වුනා පාතාලයේ ඉහලටම යන්න.

ඉස්සෙල්ලම ගේම පටන් ගත්තේ පාතාලේ බොරැල්ලෙ සුදුව දෙනෝ දහක් ඉදිරිපිටදි බොරැල්ල ටවුන් එකෙ මරලා දැම්මට පස්සේ අජිත් අයියා දෙමටගොඩ රන් කරද්දි අජිත් අයියගේ හයියෙන් බොරැල්ළ මගේ වැයික්කිය වුනා වගේම බොරැල්ළෙ මට රජ කරන්න හම්බුනා...

කොළඹට නිකන් ආපු මම කොළඹ පුරා විදුලි සැරයක් වගේ මගේ නමම කියවෙන්න ගත්තා..

මුළු කොළඹ නගරය පුරා මගේ අනසක පතුර වද්දි දෙහිවල ගුණේ එක්ක පටන් ගත්ත යුද්ධය එක දිගට ඉවර වුනේ දෙපැත්තෙම නම්ගිය සාමාජිකයන් එකිනෙකා පෝළීමට මරාගෙන..

දෙමටගොඩ පොළිසිය පවා මේ චමින්ද කියන්නෙ කව්ද කින්ද මන්ද හොයන්න ගත්තා නම් දරාපු පාතාල සමාජිකයන් සමග උරෙන් උර ගැටෙන ජීවිතේ දිනෙන් දින ඉහල ගියා වගේම. ලෙයට ලෙයක් ඉල්ලන පාතාලය  මුළු කොළඹ පුරා මගේ අනසක පතුරන්න උවමනා වුනා..

මේ මුළු කාලය පුරාම බොරැල්ලේ චමින්ද නොදන්න කෙනෙක් කොළඹ අවටින් නිකන් වත් හොයාගන්න බැරුවුනා.

එවකට ආන්ඩුවේ ප්‍රබල ඇමති කෙනෙක්ගේ උදව් ඇතුව දේසපාලන උදව් එක්ක මට කොළඹ පුරාම අනසක පතුරන්න ගියේ මාස හයකටත් අඩු කාලයක්

දෙමටගොඩ අජිත් අයියගේ පිහිටෙන් පාතාලයට බට මං අජිත් අයියගේ හොදම ගෝළයා වුනා..

පොඩි පොඩි වැරදි වලට දවස් දහ හතර මාස එක දෙක ඇතුලට ගිහින් ආවත් මං කවුද කියන එක රහසක් වුනා

අතේ තියෙන සල්ලි බලෙන් මුළු පොලිස් දෙපාර්තමේන්තුවම මගේ අතට ගන්න හැකිවුනා..

සල්ලි වලට නැමෙන්නෙ නැති කවුරුත් නැහැ කියලා සනාථ කරමින් මගේ පදේට නටන්න පවා ගොඩක් පොලිස් ලොක්කන්ට වුනා..

කුඩු කොච්චර ඇල්ලුවත් එක කෝල් එකකින් ආපහු මගේ අයව නිදෙස් කරන තැනට වැඩ කටයුතු සිද්ද වුනා.

ඒකට ගොඩක්ම හේතු වුනේ අජිත් අයියගේ දේශපාලන සම්බන්ධතා වල සහයෝගය..

අජිත් අයියගේ පිහිටෙන් මටත් පක්ෂ විපක්ෂ දේශපාලන ලොක්කො එකින් එක මුණ ගැහෙන්න ගත්තා..

ඔහොම මාස හයක් විතර යද්දි මට මතකයි එකම එක දවසක්

අජිත් අයියා මට කතා කලා..

මල්ලි මේක සීරියස් කේස් එකක්.. සුගත් දඟලනවා වැඩි ගේමක් දෙන්න ඕන..

හරි අජිත් අයියා වැඩේ කරමු.

පොඩ්ඩව දලා යන එන තැන් ඩීටේල්ස් අරන් ගස්සමු අයියා...

එහෙම හරියන්නෙ නැහැ  මල්ලියා...සුගා අමාරු කාරයා ඌට ගහන්න නම් පට්ට ගේමක් දෙන්න වෙනවා මල්ලි.

අයියා ඒක මං බලාගත්තම් වැඩේතේ වෙන්න ඕන..

හරි මල්ලියා එල ...

ඒද ඒ ප්ලෑන් එක පිට අපි පොඩ්ඩව වැඩේට සෙට් කලේ සුගාට ගේමක් දෙන්න

ඒත් පොඩ්ඩා අපිව පාවලා දිලා අපිටම ගේමක් දෙන්න හදයි කියලා අපි හිතුවේ නැහැ.

එදා එ පවාදිම මගේ ජීවිතේ උඩු යටිකුරු කලා.

සිංහල සංස්කෘතික ආයතණය ඉස්සරහා.

අව් රැගත් අපි බලන් හිටියේ සුගත් එනකන්...

ඒත් සුගත් එදා ආවේ නැහැ  සුගා පොඩ්ඩ එක්ක එකතු වෙලා අජිත් අයියට ගේමදෙන්න සැළසුම් හදලා කියලා නිකන් වත් අපි දැනත් හිටියේ නැහැ.

අපි ඒ ගේම ගහන්න බලන් ඉද්දි අජිත් අයියගේ ගමන් බිමන් සදහා ඉතුරු වුනේ පොඩ්ඩයි ශිවයි තව දහ දෙනෙක් විතරයි.

ඒක තමා එදා සුගත්ගේ ගෝළ බාලයන් අතින් අජිත් අයියා අහිමි වුනේ..

අජිත් අයියගේ ඇවෑමෙන් කිසිම ප්‍රශ්නයක් නැතුව ඒ හිස්තැන පුරවන්න මට සිද්ද වුනා..

මේ හැමදේම කරපු පොඩ්ඩා හිතුවේ නැහැ

ලෙයට ලෙයක් ඉල්ලන පාතාලයේ ඊළග ගොදුර මොහු බව...

# (පාවාදීමේ ප්‍රතිවිපාක)

මගේ අනු දැනුම ඇතුව ඊළග අභියෝගය වුනේ සුගත්ගේ ජීවිතේ හමාර කරලා ඒකේ මගේ අනසක පතුරවන්න

ඒකට මුළිබ අඩිතාලම වුනේ පොඩ්ඩාගේ ජීවිතේ හමාර කිරීම

කොටුවේගොඩ නෝනගේ නිවසේ ඉදලා එන වෙලාවක් බලලා අපේ ආයුධ සන්නද්ධ බළ ඇණිය වෙඩි පිට තියලා මුළු රාජගිරිය භීතියට පත් කරමින් පොඩ්ඩට එලව එලව වෙඩි තියන්න ගත්තා...

අඹගහ හන්දියේදි වෙඩි වරුසා රැසක් සමග පොඩ්ඩ මහපොලොව බදාගෙන නිසල වුනේ පළියට පළිය වගේ..

කොටින්ම කියනවා නම් කොහෙද හිටිය මාව තැනකට ගෙනල්ලා ගුරු හරුකම් දුන්න

මගේම සහෝදරයෙක් වගේ හිටිය අජිත් අයියව ඝාතනය කිරීම නිසා

මගේ ඊළග බලාපොරොත්තු ඉක්මනට සපල වෙන්න ගනී කියලා මම හිතුවේ වත් නැහැ.

හිටි හැටියේ මොරගස් මුල්ලේ සමුපකාරය කඩේ ගාවදී මළගේකදී සුගත් හමුවීමත් සමග..

හා මල්ලි දැන් පොඩ්ඩක් ලොකු සීන් නේ..

මේ සුගා නිකන් ආවානම් ආපු වැඩේ කරගනින් හොදෙ...නිකන් අනවශ්‍ය දේවල් කතා කරන්නේ නැතුව

අඩෝ චමින්ද උඹට ඕන ඒවා කතා කරන්න මේක උඹේ වැයික්කිය නෙමෙයි හරිද..

එහෙම කියනවත් එක්කම වගේ මගේ ඉනේ ගසා හිටිය තුවක්කුවත් සුගාගේ එකත් එක පාරටම වගේ වගේ ඉස්සුනේ...

පිස්තෝළය අතට ගත් තප්පරෙටම දෙන්නා ආපහු දගත්තේ කවුරු වුනත් මැරිච්ච කෙනාට අගෞරවයක් කරන්න බැරි කමට....

එදා මම හෝ සුගත් කොකා ගැස්සුවා නම් දෙන්නගෙන් එක්කෙනෙක් ජීවතුන් අතර නැහැ...

## (ප්‍රේමයක ආරම්භය)

දේශපාලන බල පුලුවන් කාරකම් සමග මගේ ගමන් මග වෙනස් වෙන්න ගත්තේ හිතපු නැති විදියට..

දෙහිවල නගර සභා සභාපති තීක්ෂන සමරසිංහ සමග මගේ ඇයි හොදැයිය නිසා

අත්තිඩිය බේකරිය හන්දියෙ පිහිටි නිවසට යන එන අතර දුටු අහඹු රූපයකට මගේ හිත බැදුනා..

දෛවෝපගත සිද්ධි රැසක මුල වෙයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ ඒ හමුවීම...

තීක්ෂන මන්ත්‍රීතුමාගේ ලගම නෑදෑ කෙනෙක් වුන සුන්දර නාරි රූපයෙන් දිදුලන

සුරංගනාවක් වැනි ඇය එදා ඉදන් මගේ මනසේ රැව් දෙන්න වුනා...

හංසි වීරසිංහ පෙනුමෙන් සුන්දර වූත් අහිංසක චාම් යුවතියක්..

නිතඹ තෙක් දිගු කේශ කළාපයත් දුටුවන් වශී කරවන සුළු නෙත් සගළත් නා දළු වන් දෙතොල් පෙතිත් පියකරු හිනාවත් මගේ හිත පැහැර ගත්තා..

මට ඕන කලේම මේ කෙල්ල මගේ ජීවිතේ කරගන්න.

අහඹු හමුවීමක් මේ තරම් දෙයක් කරයි කියලා මං දන්නවා නම් කවදාවත් ආපහු හැරිලා බලන්නෙත් නැහැ...

කොච්චර දරුණු කෙනෙක් වුනත් ආදරය සෙනෙහස දැනුනම වෙනස් වෙනවා කියන එක මට තේරුනා ඒත් මට මගේ රහස් රැක ගෙන හංසිත් එක්ක ජීවත් වෙන්න ඕන වුනා

ඒකට අඩිතාලම දාන්න පටන් ගත්තා..

කවදාවත් නොදැනුන දෙයක් එදා මගේ හිතට දැනුන නිසා

හංසිව බලන්න යන්න ඕනම කියන තැන ඉදලා හිටලා තීක්ෂන මන්ත්‍රීතුමා බලන්න ගිය මම දිනපතා යන්න එන්න ගත්තා..

මේක මගේ හතුරන්ට විසාල වාසියක් වෙන බව මට තේරුනත් එදා ඒ දැක්කා රූපය මගේ ජීවිතේ විශාල වෙනසක් කලා...

ඒත් එක්තරා දවසක හිතුවේ නැති විදියට ඒ කෙල්ල එක්ක කතා කරන්න ලැබුනේ අහම්බෙන් වගේ...

එදා ඒ කතාබහ දෙන්නා අතර යාළු කමක් දක්වා ඇදී ගියේ සතියක් දෙකක් යද්දි..

දෙන්නත් එක්ක දිනපතා හමුවී කතා බහ කරන්න වුනා...

පස්සේ දෙන්නට දෙන්නා ආදරේ කරන්න ගත්තත්..

මම කව්ද කින්ද මන්ද කියන කාරණය මට හංගන්න සිද්ධ වුනා...

දෙන්නගේ ආදරේ එක දිගට ගලාගෙන යද්දි හැම ආදර කතාවකටම වගේ මගේ ආදරේටත් දුෂ්ඨයෙක් ඇතුල් වුනා...

ඒක වුනේ මගේම වරදින් මාත් හංසිත් කතා කර කර ඉන්නකොට සුගත්ගේ ගෝළබාලයන් වෙඩි පිට වෙඩි තියන්න ගත්තේ මගේ පණ ගන්න හිතන්...

ඒත් වෙලාවට මම එදා හංසි එක්ක මැජෙස්ටික් සිටි බම්බලපිටිය (MC ගොඩනැගිල්ලට වම් පැත්තේ පිහිටි වලේ වගේ කඩේ බිම් මහලේ තමා පෙරේරා ඇන්ඩ් සන්ස් පිහිටා තියෙන්නෙ..)

එකේ පිහිටි පෙර්රා ඇන්ඩ් සන්ස් එකේ කෝපි එකක් බිබි කතා බහ කරමින් ඉද්දි..

මාව දාපු වාහනය දෙහිවල බීච් එකේ නතර කරලා තියෙද්දි...

දෙන්නත් එක්ක කෑම කකා කෝපි බිබි ඉන්නකොට ටිවී එකේ එක පාරටම ගිය නිව්ස් එකෙන් මං අන්දුන් කුන්දුන් වුනා..

මෙන්න දැන් ලැබුණු පුවතක්.

කොළඹ පාතාළයේ ප්‍රබල පුරුකක් වන බොරැල්ලෙ චමින්ද නැමැත්තා රැගත් වාහනයකට අද දහවල් දෙකට පමන නාන්නාදුනණ සැක කරුවන් පිරිසක් විසින් දෙහිවල බීච් එකේදී වෙඩි තබා ඇත..

මෙය ප්‍රබල පාතාළ සමාජිකයකු වෙන සුගත් නැමත්තාගෙ කල්ළිය විසින් සිදු කරන ලද්දක් බවට සැක කරන බව..

පොලිස් මාධ්‍ය ප්‍රචාරක වික්‍රම රණබාහු මහතා අප වෙත දැනුම් දෙනු ලැබුවා..

බොරැල්ලෙ චමින්ද නැමැත්තත් ඔහුගේ ප්‍රධාන සගයා වන ජයන්ත නැමැත්තා අතුරු දහන් බව වැඩි දුරටත් ප්‍රකාශ කරමින් කියා සිටියේ මේ පහරදීම සම්බන්ධව පරීක්ෂන පැවැත්වීම සඳහා..

විශේෂ බලකායක් පත් කරන බවට පොලිස්පතිතුමා පැවසූව බවත් ය...

මට උත්හිටි තැන් පවා අමතක වුනා...

කරන්නේ මොනාද හිතාගන්න පවා බැරි වුනා....

කවද හෝ මේ රහස දැන ගන්න ලැබුනොත් හංසි මොනවගේ තීරණයක් ගනීද...

මේකෙන් ගොඩ ඒමක් මට නැද්ද

එදා ඒ සිද්දියෙන් පස්සෙ හංසි හම්බවෙන්න යෑම පොඩ්ඩක් අඩුකලේ.. මං නිසා හංසිට කරදරයක් වෙයි කියලා

ඒ පහර දීමෙන් මගේ ගෝළයන් තුන් දෙනෙක් මැරුනත් ලගම ගෝළයා වෙන ජයන්ත බේරිලා තිබුනේ වාසනාවකට වගේ...

එහෙමමම බීච් එකේ හැංගිලා ඉදලා ජයන්ත පහුවෙනිද මාව හොයන් ආවේ සීතලෙන් මිරිකෙමින්...

## ( මාරයාගෙ හෝරාව)

සුගත්ගේ කල්ළිය මාව විනාශ කරන්න පස්සෙන් එලවනවා වගේම...

මගේ සහචරයන් එක එකා මරද්දි ලෙයට ලෙය ඉල්ලන මේ අන්ඩර් වර්ඩ් එකේ..

මගේ අතින් සුගත්ගේ ගෝළ බාලයන් දිනෙන් දින විනාශ වෙන්නා ගත්තා...

විවිධ පලාත් වලින් ඇවිත් මං වෙනුවෙන් දිවි තොර කරගත්ත හුඟක් අයගේ ගෙවල් වලට මිල මුදල් පවා මාස් පතා යවන්න සැලසුම් කලේ..

ඔහුන්ගේ ඒ පරිත්‍යාගයට වටිනාකමක් දෙන්න...

අවි ගත්තෝ අවියෙන් නැසෙනවා කිව්වා වගේම...

ඒ හැම ජීවිතයක්ම වෙනස් වුනේ මාත් එක්ක අත්වැල් බැද ගත්ත නිසා..

සුගත්ට ඕන වුනේ මුළු අන්ඩර් වර්ඩ් එකම රත් කරන්න...

මට ඕන වුනේ මේ හැමදේම දලා හංසි එක්ක හොදින් ඉන්න ඒත් ඒකට කළින් මගේ හැමදෙයක්ම මම කියන්න තීරණය කලා

ඒක දරාගැනීම කොහොම වෙයිද කියන්න මං දැනගෙන හිටියේ නැහැ

ඒත් ඒ හැමදේකටම මුහුණ දෙන්න බලන් මං මගේ ගමන පාඩුවේ ගියා..

මගෙත් හංසිගේ ආදරේටත් හංසිගෙ ගෙවල් වලින් පවා අවුලක් වුනේ නැත්තේ මං කව්ද කියලා හරියට දන්නෙ නැති නිසා...

හැබැයි දැන ගත්තොත් මට වෙන දේත් දැනන් හිටියා...

හංසිගේ තාත්තව හම්බෙනකම් මං දැනන් හිටියේ නැහැ හංසි කියන්නෙ කොස්වත්තේ විලියම්ගේ සහෝදරයෙක්ගෙ දුව වග...

කොස්වත්තේ විලියම් මට හම්බෙන්නෙ අහම්බෙන් අජිත් අයියා සමග මුල් වලට ගේමට බහිද්දි..

ඒ හමුවීම ටික කාලයක් යද්දි වෛරයක් වෙලා අජිත් අයියාගේ කීම නිසා දෙනෝ දහක් බලන් ඉද්දි කපලා මරන්න තරම් දරුණු වුනා...

එද ඒ සිදුවීමෙන් පස්සෙ කොස්වත්තත් අජිත් අයියගේ අනසකට යටත් වුනා...

කවුරුත් මුකුත් නොකියන තරමට මුළු බත්තරමුල්ල පුරා අපේ අනසක පතුරන්න පුළුවන්

මාව දුටු ගමන් කිසිම හාවක් හූවක් නැතුව හිටිය හංසි හිනාවුනේ මොකෝ මේ මේ ඉන්නේ අපේ තාත්තා ඔයාව බලන්න ඕන කිව්වා...

ඒ වචන වල තිබ්බෙම මට මාරම සෙනෙහසක් වග මට පෙන්නුවා.. මගේ ඇත්ත කතාව විස්තර කරද්දි..

ඔහුත් පුදුමෙන් වගේ බලන් හිටියේ මේක විශ්වාස කරන්න බැරි කතාවක් විදියට පෙනුමෙන් අහිංසක මගේ ජීවිතේ ගොඩක් දේවල් එදා වුනා ඒ වුන දෙවල් වල අනිසි විපාකය තමාමේ මං ගත කරන්නෙ...

ඔව් ඕගොල්ලො බලනවා ඇති ඇත්තටම හංසි ඇයි මාව මරන්න තරම් දරුණු වුනේ කියලා..

එතන මටත් වැරදුනා.. ඒ විළියම්ගේ සහෝදරයෙකුගේ දුවෙක් නෙමෙයි විළියම්ගේ දුව කියලා දැනගත්දි මට වෙන්න ඕන දේවල් මං වෙනස් කරන් ඉවරයි...

විළියම්ගේ ඝාතනයෙන් ඔක්කොම ඉවරයි කියලා හිතුවට මට පිහියෙන් අනිනකන් දන්නේ නැහැ ආදරයත් වෛරයත් අතරට පළි ගැනීම ආවම කොච්චර කොච්චර දරුණු දෙයක්ද කියලා

ඒත් මම දන්නවා එකම එක දෙයයි.

මේක මගේ උරුමේ වෙන බව.. මරණය පිටේ බැදන් යන ගමනක කියලත්...

අවුරුදු දෙකක් ආශ්‍රය කරලත් මට ගෑනු කියන ජාතිය තේරුම් ගන්න බැරි වුනා...

# ( වෛරයක ආරම්භය)

එදා මගේ විස්තර ඔක්කොම කියලා ආපු මං ගැන හංසිගේ හිතේ ආදරයක් ඇති වුනාද නැද්ද මං දන්නෙ නැහැ ඒත් ඒක මගේ ජීවිතේම වෙනස් කරන බව මම දැනන් හිටියෙත් නැහැ

අපි දෙන්නා අලුත් මගක යන්න හීන ගොඩක් මැව්වා ඒ හීන වලට එකින් එක හංසිගේ කීම පිට මං පය තිබ්බ ඒ කුරිරු ලෝකෙන් සමුගන්න මං පටන් ගත්තා..

මගේ වැඩ වලින් ටික ටික ඈත්වුනේ ජීවිතේ අලුතින් පටන් ගන්න ඒකටත් දෛවය කිහිප සැරයක්ම අකුල් හෙළුවා මේ නරකාදියෙන් එළියට එන්න හදන හැම වෙලේම මොකක් හරි දෙයක් මගේ පැත්තට කැරකෙන්න ගත්තා...

ඒක නිසා මගේ ව්‍යාපාර ඔක්කොම නතර කරලා වෙනස් වෙන්න හිතන් වෙනස්ම නමකින් ජීවත් වෙන්න ඕන කියලා හිතට ගත්තා...

හම්බ කරගත්ත මහ මුදලින් සුළුම මුදලක් පමනක් ඉතිරි කරන් මං ගම්පහ දිස්ත්‍රික්කෙ ජා ඇළ ඒකළ ප්‍රදේශයේ ගෙයක් අරගත්තේ කාටවත් නොදැනෙන්න..

මගෙත් හංසිගෙත් ආදර කතාවත් කිසිම හාවක් හූවක් නැතුව ඇදිලා ගියා..

ගෝළ බාලයන් මුළු කොළඹම රත් කරද්දි මං පැත්තකට වෙලා ඒකළ ගෙදරට වෙලා පාඩුවේ ජීවත් වෙන්න වුනා...

මාස දෙකක් විතර යද්දි සුගතුත් මාත් අතර ඉහල ස්ථානය වෙනුවෙන් ලොකු සටනක් ඇති වුනා ඒ සටනින් මගේ ගෝළ බාලයෝ රැසක් මියදුනා වගේම සුගත්ගේ ගෝළ බාලයන් රැසක් එක්කා සුගතුත් අවසන් ගමන් ගියේ ස්වභාව දහම් නීතියට යටත්ව....

අවි ගත්තො අවියෙන් අවසන් ගමන් යයි කියන කරුණ සනාථ කරමින්..

සුගත් අවැමෙන් පාතාලයේ කිරුළු පළන් රජු වෙන්න මට පුලුවන් වුනා..

ඒකළ ඉදන් කොළඹ පාතාළය ජයන්ත අයියගේ අනු දැනුම යටතෙ පාළනය කරන එක මට ගොඩක් ලේසි වුනා..

කොළඹ පුරාම මගේ මහ පරිමාණ කුඩු ව්‍යාපාරය දියුණු කරන්න වගේම අළුත් කොල්ලන් මගේ පස්සෙන් රදව ගන්නත් මං වෙනස්ම දෙයක් කරන්න ගත්තා..

ලැබෙන ආදයමෙන් සීයට දහයක පමන මුදළක් සමාජයේ තරුණ ප්‍රජාව අතර බෙදන්න ගත්තේ ඔහුන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන්..

මම දැනන් හිටියා මේකේ අවසානය ඉවරවෙන්නෙ කොතනින්ද කියලා

ඒක නිසා මට ඕන කලේම මේ හැමදේම අතහැරලා මගේම කියලා ලෝකයක් හංසිත් එක්ක ගෙවන්න...

ඒකට අඩිතාලම හෙමින් හෙමින් හදගත්තා ඒකළ බස් නැවතුම් පොළ අසලින්

කඩ කාමර දෙකක් අරගත්තේ පොඩි ව්‍යාපාරයක් කරන අදහසින්..

චින්තක ගිෆ්ට් අයිටම් නමින් කඩයක් හා චින්තක කොමියුනිකේෂන් නමින් කඩයකුත් දලා හිමිහිට බිස්නස් එක හදාගන්න ගත්තා..

ටවුම් එකට අලුතෙන් ඇවිත් බිස්නස් කරනකොට කොයි නගරෙත් වෙනවා වගේ කප්පම් දීම් කරන්න වෙනව..

මුළු කොළඹම කප්පම් ගත්ත මට කප්පම් දෙන්න වුනා කිව්වොත් ඔබලට පිස්සු හැදෙයි..

ඔව් මම දන්නා ඒකළ චුට්ටෙ නම් නමින් හඳුනන වීරසිංහගේ මනොජ් සිල්වාට..

ඒත් මගේ අතීතය හාර අවුස්සල බැලුවොත් මේ අවුරුදු හතර තුල මං ඉන්න තැනත් අද චුට්ටෙ ඉන්න තැනත් අතර බලද්දි

තාම චුට්ටෙ අත් පොත් තියෙනවා...

මම කව්ද කින්ද මන්ද නොදකින තරමට මට වාසි බව තේරුනා..

චුට්ටෙගේ කට්ටිය එන හැම වෙලාවෙම සල්ලි ටිකක් වැඩියෙන් දෙන්න පුරුදු වුනේ මට ගොඩක් ප්‍රයෝජනවත් වෙයි කියලා හිතුන නිසා.

# ( වෙනස් වූ ජීවිතේ)

ඒත් එක දවසක් ජයන්ත කඩේ ලගට එනකන් ඔක්කොම හොදින් සිද්ධවුනා..ජයන්ත කඩේට එනවත් එක්කම වගේ..

චූට්ටෙත් කඩේට ආවේ එකම වෙලාවේ කරගන්නෙ මොනාද කියලා හිතාගන්න බැරුව මං ගොළු වුනා..

හා මහත්තයා හුග දවසකින් ආවේ..

මගේ ගාන ගත්තනම් අද ටිකක් වැඩියෙන් ඕන...

එහෙම කිව්ව ගමන් ජයන්ත චූට්ටෙ දිහා කන්න වගේ බලන්න ගත්තා

ඇයි අයියා මොකො ආවනම් පාඩුවේ යනවද ආපු වැඩේ බලාගෙන..

එහෙම කිව්වා වුනත් චූට්ටෙගේ මූහුණේ ප්‍රෙහෙලිකාවක් වගේ මතු වුනා..

මේ අයියව මට කොහෙන් හරි දැකලා පුරුදුයි වගේ..

මාව? එහෙම වෙන්න බැහැ.

වෙන්න බැරි කොහෙද හොදට මතකයි වගේ අපි හම්බෙලා තියෙනවා

ඇයි මල්ලි ගිය මාසේ ඔයා එද්දි කඩේට ඇවිල්ලා හිටියේ ළමයට ප්‍රින්ට් අවුට් වගයක් අරගන්න..

එහෙම කියලා මං ජයන්තට යන්න කියලා අතින් සන් කලා..

හා ඒක වෙන්න ඇති මට මතක එහෙනම් රත්තරන් මහත්තයෝ මං යන්නම් එදා කරපු උදව්වට ගොඩක් ස්තූති මහත්තයා

එහෙම කියපු ජයන්ත අයියා කඩෙන් එළියට ගියා..

හා අයියා විනාඩියක් දෙන්න බලන්න කීයක් තියෙනවද බලන්න

මට තියෙන ගාන වැඩක් නැහැ මල්ලියා

මේ මාසේ ඉදන් පහලොවක් ගෙවන්න ඕන මගේ උන්ට..

අනේ එහෙම කරන්න එපා අයියා මේ දවස්වල බිසනස් ටිකක් අඩුයි අයියා..

මල්ලි මට බොගේ අඩු වැඩි වැඩක් නැහැ කිව්ව වැඩේ වෙන්න ඕන එච්චරයි ..

හා අයියා දෙන්නම් අයියා...

ලාච්චුවෙන් රුපියල් පහලොස් දහක් අරන් අතේ තියන සල්ලිත් දලා දෙනවා වගේ

මං සල්ලි චූට්ටෙට දූන්නා..

සල්ලිත් අරන් එතනින් ගිහින් විනාඩියක් යන්න හම්බුනෙත් නැහැ

ආපහු ජයන්ත අයියා කඩේට ආවා..

මොනාද චමින්ද මල්ලි මේ කරන්නේ ඔලුවට තියන්නෙ නැතුව..

ජයන්ත අයියා කට කට...මේක කඩයක්...

මං ඒක කිව්වෙ කඩේ තව කට්ටිය ඉන්න බව මතක් කරන්න...

ඔය විදියට මගේ ජීවිතේ සාමකාමිව ගෙවිලා ගියා.

මගේ බිස්නස් තත්වෙත් ගොඩක් හොද අතට හැරුනා..

ඒකළ ගම පුරා හැමෝම මගේ කඩේටම එන්න ගත්තේ අඩුවට දෙන්න ගත්ත නිසා...

අනිත් කඩ එක්ක බලද්දි මම තමයි අඩුවෙන්ම බඩු දෙන්න ගත්තේ

පොඩි ලාබයක් වුනත් මට ඕන කලේ මිනිස්සුන්ගේ විස්වාසේ දිනාගන්න..

ඒ විශ්වාසය ඒ විදියට දිනාගෙන මගේ ව්‍යාපාර දියුණු වෙන්න පටන ගත්තා

ඒකට අකුල් හෙළපු කට්ටිය නොහිටියා නෙමෙයි ඒත් ඒකළ නගරයෙන් වැඩිම මිනිස්සු ප්‍රමානයක් වගේම චූටිටෙගේ හිත දිනාගෙන හිටිය නිසා මට ආපු හැම කේස් එකක්ම ගනන් ගත්තේ නැහැ

කඩෙත් එක්ක ලොකු සමීප සම්බන්ධකමක් චූට්ටෙට ඇති වුනා..

ඇවිල්ල මාත් එක්ක වරු ගනන් කතා කර කර ඉදලා යන තැනට පත්වුනා

ඒක නිසා හුඟක් අය මට පොඩ්ඩක් බය ගතියකුත් තිබ්බා ඒත් යටින් ගිණි ගෙඩි ඇද්ද..

## ( පොලීසියේ ආගමනය)

එදා ඉරිදා දවසක් ඒකළ පොළිසියෙන් මට හදිසියේ එන්න කියලා පනිවිඩයක් එවලා තිබ්බා..

ඒ වෙනකොටත් හොර පාස්පොට් වගේම හොර අයිඩෙන්ට් කාඩ් හදලා තිබ්බා..

කිව්ව පරිදි ඒකළ පොලිස් ස්ථානාධිපති මහත්තයා හම්බෙන්න මම ගියා..

හා එන්න එන්න චින්තක මහත්තයා

එහෙම කිව්ව ගමන් මම ස්ථානාධිපති තුමාගේ කාමරයට ගියා...

මූහුණ දිහා දෙපාරක් විතර බලපු ස්ථානාධිපතිවරයා

මේකයි මිස්ටර් සේනක මම ඔයාට එන්න කිව්වෙ..

ඔව් ස්ථානාධිපතිතුමා කියන්න

චින්තක මහත්තයට විරුද්දව පැමිණිල්ලක් දලා තියෙනවා චුට්ටේ එක්ක ආස්‍රය කරනවා වැඩියි කියලා..

වගේම මොනා හරි බිස්නස් කරනව කියලත් අපිට පැමිණිලි කරලා තියෙනවා..

අනේ සර් එහෙම දෙයක් මොකුත් නැහැ මම ඈත පළාතක ඉදන් මේ ටවුන් එකට ආවේ බොහොම දුක් විදලා බඩට නොකා කීයක් හරි ඉතුරු කරගෙන ජීවත් වෙන්න..

ඒකටත් එක එක කතා හදනවා නම් මම ආපහු ගමටම යන්නම් මහත්තයා

එහෙම කිව්වෙ මම හොද කෙනෙක් කියලා පෙන්නන්න..

හරි හරි චින්තක මහත්තයා යන්නකෝ මම මොකක් හරි දෙයක් කරන්නම්කෝ..

එහෙනම් ගොඩක් ස්තුති මහත්තයෝ මම එන්නම් ඕන වුනොත් ඒ පැත්තේ එන්නකෝ..

මම පුලුවන් විදියට උදව් කරන්නම්කෝ..

එහෙම කියලා මං ඒකළ පොලිස් ස්ථානයෙන් එළියට ආවා..ඇවිත් කඩේට ආවේ කඩේ වැඩ කරන ළමයි ටිකගේ පඩිත් දෙන්න ඕන නිසා

## ( නරකාදි බිස්නස් අත හැරීම)

ඒකළ කඩෙන් එන ආදායමෙන් ජීවිතේ ගෙනියන ගමන් ලග හිටිය ගෝළ බාලයෝ ඔක්කොම ගම් වලට හා රටවල් වලට යැව්වෙ මට ඕන වුනා මේ නරකාදියෙන් මගේ ලග හිටිය අයව බේරගන්න..

එහෙමම නරා වලේ හිටිය හැමෝම වගේම

ඒ නරක බිස්නස් එකත් නවත්තන්න

ඔව් මම මෙතෙක් දවසක් කරන් ආපු කු/ඩු බිස්නස් එක නවත්තලා දලා ජයන්ත අයියටත් ගමේ යන්න කිව්වා..

ඒකළ නගරේ පුරා සාමන්‍ය කෙනෙක් වගේ ජීවත් වෙන්න මට පුලුවන් වුනා..

කිසිම බයක් නැතුව නොදන්න කෙනෙක් ලෙස මගේ ජීවිකාව ගෙන ගියා ඒත් මං එකම එක දෙයක් සහසුද්දෙන් දැනන් හිටියා..

මගේ අතීතය මගේ පස්සෙන් එන වග.. නිදහස් ලෙස අවුරුද්දක් විතර කිසිම කරදරයක් නැතුව ගෙවිලා

හැමෝගෙම හොඳ හිත දිනාගෙන හිටිය මට ඕන වුනා ටික දවසකට ගමේ යන්න

මගෙත් හංසිගෙත් ආදර කතාවට අවුරුදු තුනකට වැඩියි ඉතින් මං තීරණය කලා.

ආපහු ගමේ ගිහින් හංසි එක්කම අවුරුද්දෙන් පස්සෙ එන්න...

ජීවිතේ බලාපොරොත්තු ඔක්කොම පොදි බැඳන් අනුරාධපුරය බලා යන දුම් රිය පොළට වෙලා හිටියේ හංසිත් එනකන්..

ඒත් දෛවෝපගත සිද්දි කොච්චර වෙනවද..

මං පණ වගේ ආදරේ කරලා තිබ්බේ

මගේම පණ නසන්න වෙර දරන වෛරක්කාරියකට බව තේරෙද්දි මම පහුවෙලා ඉවරයි...

ඔව් මගේ අවසන් හුස්මත් මේ වායු තලයට තික්ම පුලුවන්...

ඒත් ඒ හැම දේකටම පෙර මට කියන්න දෙයක් තියෙනවා අව් ගත්තෝ අව්යෙන් නසී කියන න්‍යාය කිසිම දවසක බොරුවක් කරන්න බැහැ වගේම..

තමන් කර පාපයන් වලින් කවදවත් බේරෙන්න බැහැ... මෙතනින් එහාට මට මොනා වෙයිද කියන්න බැහැ...

## ( පාපොච්ඡාරණය)

එදා මගේ වෙලාවට පොළිසිය හිටිය නිසා මාව ඉක්මනට රෝහළට අරන් යන්න පුළුවන් වෙලා..

දවස් තුනක් තිස්සෙ රෝහලේ දැඩි ආරක්ෂාව යටතේ මාව තියන් ඉදලා තියෙනවා ඒකත් හංසිගෙන් කට උත්තර ගත්තට පස්සෙ...

දිගින් දිගටම අහන ප්‍රශ්න වලට උත්තර දෙන්න පටන් ගත්තේ තවත් හංගන් ඉදලා වැඩක් නැති නිසා..

මගේ නමට ඇති එකම එක පොටෝ එක හා සංසන්දනය කරනකොට එදා ඒ තිබ්බ පොටෝ එකෙයි දැන් මුහුණෙයි අතර ලොකු වෙනසක් තියෙන නිසා මමද කියලා දැනගන්න මගෙන් එක දිගට අහන්න වුනා..

කොළඹට පය තිබ්බ වෙලාවේ ඉදන් මේ වෙනකන් වෙච්ච හැමදෙයක්ම අකුරක් නෑර කියන්න ගත්තේ මං කරපු පව් කවද හරි මං ගෙවන්න ඕන නිසා..

මගේ අතීත් අය ගැන විස්තර අහද්දි මට කියන්නම වුනේ ඔහුන් මිය ඇදුන බව

ඒත් ඒ හැම කෙනෙක්ම කොහේ හෝ සැපෙන් ඇති කියන විශ්වාසය උඩ මං මගේ දඩුවම් විදින්න ලෑස්ති වුනා...

# ( මරණීය දඬුවම)

වර්ෂ දෙදහස් විස්සක් වුන මැයි මාසේ විසිවන බදදා අද දිනය කොළඹ මහධිකරණය මාව රැගත් බන්ධනාගාර රථය වැළිකඩ හිර මැදිරියේ සිට කොළඹ මහධිකරණයට උදේම පිටත්වෙලා ආවේ වෙලාවට උසාවියේ ඉන්න...

මාත් සමග තවත් සිර කරුවන් දහ හතර දෙනෙක් අරන් ආවා සුළු සුළු වැරදි හා මංකොල්ල කෑම් වැනි වැරදි සදහා..

නඩු අංක අනු පන්දහස් හටයිය තිස් හත ගී කියනකන්දගේ චමින්ද නුවන් දල්පදදූ නඩුවාර තුනකට පස්සෙ මගේ වාරේ ආවා...

මම විත්ති කූඩුවට නැග්ගා..

මං වෙනුවෙන් රජයෙන් නීතිඥ මහත්තයෙක් දෙන්න වුනා..

පොළිසිය වෙනුවෙන් තවත් නිතිඥයෙක් වෙනම රජයෙන් ඉදිරිපත් කලා..

ඉස්සරහට පැමිණි තෝල්කයා විසින්..

මා හට ඇති චෝදනා ඉදිරිපත් කලා..

ස්වාමින් වහන්ස මොහුට ඇති චෝදනා වන්නේ..

අනිසි බිය ගැන්වීම් කප්පම් ගැනිම්

ජීවිත විනාශ කිරීම් හා මත්කුඩු ව්‍යාපාරය..යන චෝදනා මේ චූදිතයට යොමු කර සිටිනවා..

වගේම මේ තියෙන්නෙ ඔහු දුන් පාපොච්චාරණයේ හඬ පටියත් සියළු වැරදි ඔහු කර බවට අත්සන් කෙරූ කොළයේ ඔරිජිනල් පිටපත්.......

විනාඩි හතලිහක් විතරම උසාවිය නිහඬව ගත වුනා..

මේ ගොනු කරලා තියෙන අපරාධ වලට යුෂ්මතා වැරදි කරුද නිවැරදි කරුද..

ඔන්න ජීවිතේ ගන්න ඕන හරිම තීරණය වැරදි කරු කිව්වොත් ජීවිතේ මෙතනින් ඉවර වෙනවා..

නිවැරදි කරු කිව්වොත් නඩුව පස්සට යනවා...ගන්න ඕන හරිම තීරණේ...

වැරදිකරු ස්වාමිනී...කවදාවත් නැති විදියට හිතට මාරම සතුටක් ආවා..

මේ ඉන්නේ ඒ මොහොතේ හැමොම පුදුමෙන් වගේ බලාගෙන ඉන්න එක ගැන මට මාරම සතුටක් දැනුනා..

එක්කො හිතන්න ඇති මට පිස්සු කියලා

එහෙම නැත්තම් මෝඩයි කියලා...

කවුරු කොහොම හිතුවත් මට මොකද

මම දන්නවා මේක තමා විය යුත්තේ කියලා

හුඟක් අයට ප්‍රෙහෙලිකාවක් වුනත් මට එපා වෙලා තියෙන්නෙ දූවලම දැන් හති වැටිලා ඉවරයි..

මගේ නම ඉදිරියේ වැටෙන්න ඕන දරුණුම නම වැටිලා තියෙද්දි හීන මාළිගා ගොඩ නගපු හංසිත් මට නැති වුනාම කවුරු වෙනුවෙන් ජීවත් වෙන්නද..

උන්නද මලාද නොබලපු අම්මා තාත්තද..

නැත්තම් කව්ද..

මගෙ දැහැන බිඳුනේ නඩු කාර තුමාගේ තීන්දුව එක්කම..

මා හට ලැබී ඇති සියළු සාක්ෂි හා කරුණු සලකා බලා..

බොරැල්ලෙ චමින්ද හෙවත් ගී කියනකන්දගේ චමින්ද නුවන් දල්පද්දූ ඔබට ජීවිතාන්තය දක්වා සිර දඩුවම් නියම කරනවා...

විත්ති කූඩුවෙන් බිමට බස්සපු මාව ආපහු උසාවියේ කූඩුවට දැම්මා

ජීවිතේ කිසිම බලාපොරොත්තුවක් මට දැන් ඉතිරි නැහැ.......

අදින් පස්සෙ මගෙ ජීවිතේ අනාගතයක් නැහැ ..

..නිමි..

## පසුවදන

මේක මේ ගෙන්දගම් පොළොවේ කොලොම්තොටට ගොඩ බට එක්කෙනෙක් හෝ කිහිප දෙනෙකුගේ කතාවක්

වෙන්න පුළුවන් අහිංසක තරුණ ජීවිත

මේ වගේ ව්‍යසනයන් වලින් බේරගන්න යුතුකම මේ සමාජෙට වගේම සාමය රකින

මනුස්සකම සුරකින හැමෝටම කරන්න පුළුවන් දෙයක්...

තාමත් මෙවැනි ක්‍රියා මේ සිහළදීපයේ කොහේ හෝ තැනක වෙනවා විය හැකියි...

මේකත් එක්තරා කතාවක්.. අපි අහලා තියෙන බිත්ති හතර පවා රත්වෙන යකඩ මිනිස්සු ගැන..

දිළීප පෙරේරා